සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# තෙවන වාර පරීක්ෂණය 2020

11 ශ්‍රේණිය | ක්‍රිස්තියානි ධර්මය I | කාලය පැය 1 යි

නම/ විභාග අංකයඃ

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40 ක් හිමිවේ.
- 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1, 2, 3, 4 පිළිතුරුවලින් නිවැරදි පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.

01. ''අපට ළදරුවෙක් උපන්නේ ය. අපට පුත්‍රයෙක් දෙන ලද්දේ ය.'' මෙසේ කිතු උපත සම්බන්ධයෙන් දිවැස්වැකි ප්‍රකාශ කරන ලද්දේ,
    (1) මලාකි දිවැසිවරයා ය. (2) යෙසායා දිවැසිවරයා ය.
    (3) මීකා දිවැසිවරයා ය. (4) ආමොස් දිවැසිවරයා ය.

02. ''ලෝකයේ පව් දුරුකරන දෙවියන්ගේ බැටළු පෝතකයාණන්'' ලෙස ජේසුස් වහන්සේ හඳුන්වා දෙනු ලැබුවේ,
    (1) ස්නාවක ජොහන් විසිනි. (2) යෙසායා දිවැසිවරයා විසිනි.
    (3) සිමියොන් අනාගතවක්තෘ විසිනි. (4) ගාබ්‍රියෙල් දේවදූතයා විසිනි.

03. පැමිණෙන්නට සිටින තැනැන්වහන්සේගේ රාජ්‍ය තුළ දක්නට ලැබෙන වටිනාකම් වන්නේ,
    (1) යුක්තිය හා සාධාරණත්වය (2) යුක්තිය හා ප්‍රේමය
    (3) යුක්තිය හා ධර්මිෂ්ටකම (4) යුක්තිය හා සාමය

04. පහත අය අතුරින් දේවදූත හඬට කිකරු වූ පුද්ගලයන් ඇතුළත් වරණය වන්නේ,
    A එඬේරු
    B ශාස්ත්‍රවන්තයන්
    C මරියතුමිය
    D එළිසබෙත්තුමිය
    E ජෝසප්තුමා
    (1) A, B හා E (2) A, C හා E (3) A, B හා C (4) A, C හා D

05. ''බලන්න මම ස්වාමින් වහන්සේගේ දාසිය වෙමි. ඔබ පැවසූ ලෙස මට ඉටුවේවා.''
    මරියතුමියගේ ඉහත ප්‍රකාශනය තුළින් අපට ආරාධනා කරන්නේ,
    (1) නිහතමානිකම ඇතිකර ගැනීමට ය.
    (2) කීකරුකම ජීවිත පුරුද්දක් කර ගැනීමට ය.
    (3) එකිනෙකාට විවිධ කැඳවීම් තිබෙන බව අවබෝධ කරවීමට ය.
    (4) තමකම නසා දේව හඬට අවනත වීමට ය.


06. ''මෙසියස්'' යන්නෙහි අර්ථය වන්නේ,
    (1) ආලේප කරනු ලැබූ තැනැත්තා යන්න ය. (2) කැපකළ තැනැත්තා යන්න ය.
    (3) ගැළවුම්කාරයා යන්න ය. (4) සාමයේ කුමාරයා යන්න ය.

07. ඊශ්‍රායෙල් ජනතාව විනයගරුක ජනතාවක් කිරීමට උපකාරී වූයේ,
    (1) කන්ද උඩ දේශනාවයි. (2) දස පනතයි.
    (3) පංච පුස්තකයයි. (4) මිටියාවතේ දේශනාවයි.



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

08. මෙහි දක්වා ඇත්තේ ජුදෙව් චාරිත්‍ර කිහිපයකි. ඉන් එකම අවස්ථාවේ දී සිදුකරනු ලබන චාරිත්‍ර වන්නේ,





(1) චර්මඡේදනය හා කුළුඳුලන් කැපකිරීමයි.
(2) කුළුඳුලන් කැපකිරීම හා නම් තැබීමයි.
(3) චර්මඡේදනය හා නම් තැබීමයි.
(4) ඉහත චාරිත්‍ර සියල්ලමයි.

09. ඊශ්‍රායෙල් ජනතාව අතර එඬේර වෘත්තියේ යෙදුනු පුද්ගලයන් අයත් වරණය වන්නේ,

(1) ආබෙල්, ජාකොබ් හා දාවිත් ය. (2) ආබෙල්, දානියල් හා දාවිත් ය.
(3) ආබෙල්, සැම්සන් හා දාවිත් ය. (4) ආබෙල්, සාවුල් හා දාවිත් ය.

10.




ඉහත රූප සටහනේ සඳහන් අය අතුරින් ජේසුස් වහන්සේ ආබ්‍රහම්ගේ දියණියක් ලෙස හඳුන්වා දෙනු ලැබුවේ,

(1) A ය. (2) B ය. (3) C ය. (4) D ය.

11. සමාව ගැන පැවසෙන වැදගත්ම ප්‍රකාශය වන්නේ,

(1) ඉල්ලූ විට සමාව දිය යුතු බවයි.
(2) සත්වාරයක් නොව සැත්තෑවාරයක් ලෙස අසීමිතව සමාව දිය යුතු බව.
(3) සමාව යැදීම සඳහා පසුතැවිල්ල වැදගත් බව.
(4) ඉර බසින තුරු කෝපය තබා නොගත යුතු බව.

12. දේශද්‍රෝහීන් හා පව්කරුවන් ලෙස ජුදෙව් ජනයාගේ පිළිකුලට භාජනය වුයේ,

(1) අයකැමියන් ය. (2) සද්දුසිවරුන් ය. (3) පරිසිවරුන් ය. (4) නායක පූජකයන් ය.

13. රෝගීන් සුවපත් කිරිමේ දී ජේසුස් වහන්සේගේ අපේක්ෂාව වුයේ,

(1) දේව රාජ්‍ය ප්‍රකාශ වීමයි. (2) හාස්කම් කිරීමයි.
(3) බලය විදහා පෑමයි. (4) රෝගී වූවන්ට අනුකම්පා කිරිමයි.

14. A ලිඛිත ව්‍යවස්ථාව පිළිපැදීම

B පුනර්ජීවනය හා දේවදූතයන් විශ්වාස කිරීම.

C ආගමික නීතිරීති හා චාරිත්‍ර ආරක්ෂා කිරීම.

D සාම්ප්‍රදායික හා ගතානුගතික වත්පිළිවෙත් වලට වහල් වීම.

ඉහත ලක්‍ෂණ අතුරින් සද්දුසිවරුන් සතු ගති ලක්ෂණ ඇතුලත් වරණය වන්නේ,

(1) A හා C (2) A හා D (3) B හා C (4) A හා B

15. සමාරියේ ජීවත් වූ ධනපතියන්ගේ භාර්යාවන් තරබාරු එළදෙනුන් ලෙස හඳුන්වනු ලැබුවේ,

(1) යෙසායා දිවැසිවරයා ය. (2) ජෙරමියා දිවැසිවරයා ය.
(3) මීකා දිවැසිවරයා ය. (4) ආමොස් දිවැසිවරයා ය.

16. ජේසුස් වහන්සේ උත්ථානයේ හා ස්වර්ගාරෝහනයෙන් පසු ශ්‍රාවකයන්ගේ සාක්ෂි දැරීමේ පදනම වූ අත්දැකීම වන්නේ,

(1) යක්ෂ ආත්ම දුරුවීම. (2) රෝග සුවවීම.
(3) මළවුන් උත්ථාන වීම. (4) රූප විපර්යාසය සිදුවීම.

17. ජේසුස් වහන්සේට විරුද්ධව නඩු විභාගය සිදුවන අවස්ථාව වන විට පොන්තියුස් පිලාත්

(1) ගලිලියේ රජුය. (2) ජෙරුසලමේ ආණ්ඩුකාරයා ය.
(3) ජුදයේ රෝම ආණ්ඩුකාරයා ය. (4) ජුදයේ ප්‍රජා මූලිකයා ය.

18. දේව රාජ්‍යයේ ප්‍රතිපත්ති හා අපේක්ෂණ දක්වන උපමාව ඇතුලත් වරණය වන්නේ,

(1) නැතිවූ පුත්‍රයා, මුහුන් හා නැති වූ බැටළුවා

(2) නැති වූ කාසිය, නැති වූ පුත්‍රයා හා මහා මංගල භෝජනය

(3) මහා මංගල භෝජනය, වපුරන්නා හා නැති වූ පුත්‍රයා

(4) අබ ඇටය, නැති වූ පුත්‍රයා හා නැති වූ කාසිය

19. ජේසුස් වහන්සේ දේව පුත්‍රයා ලෙස සොබාදහම කෙරෙහි තම ආධිපත්‍යය අනාවරණය කරමින් කරන ලද ප්‍රාතිහාර්ය ඇතුලත් වරණය වන්නේ,

A මහලේ රෝගී ස්ත්‍රිය සුවපත් කිරීම.

B මාරුත දමනය කිරීම.

C පන්දහසකට කෑම දීම.

D නායින් නුවර වන්දඹුවගේ පුත්‍රයා මරණින් උත්ථාන කිරීම.

(1) A හා B ය. (2) B හා C ය. (3) B හා D ය. (4) C හා D ය.

20. ජේසුස් වහන්සේ මෙන් අපද අපගේ ඉලක්කයන් හඳුනාගත යුතු බව පෙන්වා දෙන අවස්ථාවකි.

(1) පරීක්ෂාවන් ජය ගැනීම.

(2) වයස අවුරුදු 12 දී දේව මාළිගයේ රැඳී සිටීම.

(3) දේව මාළිගය පවිත්‍ර කිරීම.

(4) දරුවන් පිළිගැනිම.

21. නායකත්වය දරන්නට කැමති කිතුණුවා හැමවිටම

(1) තම අයිතිවාසිකම් රැකගැනීමට උත්සහා කළ යුතුය.

(2) වගකීමෙන් යුක්තව කටයුතු කළ යුතුය.

(3) සේවකයෙකු මෙන් ක්‍රියා කළ යුතුය.

(4) අන් අයගෙන් උපස්ථාන ලැබිය යුතුය.

22. ජේසුස් වහන්සේගේ ශ්‍රාවකත්වයට කැඳවීම ලත් අයකැමියා වූයේ,

(1) මතෙව් ය. (2) තෝමස් ය. (3) පිලිප් ය. (4) ජාකොබ් ය.

23. ජුදෙව්වන් අතරින් නායක පූජකයන් හා වැඩිමහල්ලන් තේරී පත් වූයේ,

(1) පරිසිවරුන් අතුරිනි. (2) ලියන්නන් අතුරිනි.

(3) විනයධරයන් අතුරිනි. (4) සද්දුසිවරුන් අතුරිනි.

24. පාපයේ කුරිරු මාර්ගයෙන් මිදී හැරී එන තුරු දෙවියන් වහන්සේ අසීමිත ප්‍රේමයෙන් බලා සිටින බව පෙන්වා දීම සඳහා යොදාගන්නා ලද උපමාව වන්නේ,

(1) නැති වූ බැටළුවා පිළිබඳ උපමාවයි. (2) නැති වූ කාසිය පිළිබඳ උපමාවයි.

(3) නැති වූ පුත්‍රයා පිළිබඳ උපමාවයි. (4) මහා මංගල භෝජනය පිළිබඳ උපමාවයි.

25. ජුදෙව් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ගෙන ආ ජේසුස් වහන්සේගෙන් අසන ලද ප්‍රශ්න වලින් ඔවුන් බලාපොරොත්තු වූයේ,

(1) ජේසුස් වහන්සේ වරදකරු බවට පත් කිරීමයි.

(2) ජේසුස් වහන්සේගේ වචන උන්වහන්සේට ම විරුද්ධ ව සාක්ෂි ලෙස යොදා ගැනීමයි.

(3) ජේසුස් වහන්සේ සිරගත කිරිමයි.

(4) ජේසුස් වහන්සේ පීඩාවට පත්කිරීමයි.

26. දේව රාජ්‍යය තුළ සැබෑ පොහොසත්කම යනු

(1) දේව වචනයෙන් සන්නද්ධ වීමයි. (2) දේපල ඉඩකඩම් වලින් සන්නද්ධ වීමයි.

(3) අධ්‍යාපනයෙන් ඉහළට යෑමයි. (4) අයහපත් ගුණාංග වලින් හිස්වීමයි.

27. තමා සන්තක සියල්ල සාතන් විසින් අහිමි කළත් දෙවිඳුන් අත්නැර ජීවත් වූයේ,

(1) යෙසායා ය. (2) ජෝබ් ය. (3) ආබ්‍රහම් ය. (4) ආමොස් ය.

28. පළමුවරට ශ්‍රාවකයන්ට ක්‍රිස්තියානි යන නම දෙනු ලැබුවේ,

(1) කොරින්ති සභාවේදී ය. (2) අන්තියෝකි සභාවේදී ය.

(3) පිලිප්පි සභාවේදී ය. (4) කොලොස්සි සභාවේදී ය.

29. ''පල්ලියේ ගොඩනැගිල්ල ජනතාව සඳහායි'' යන ආකල්පයෙන් ජනතාව උදෙසා තම ලැගුම්ගෙය පවා පරිත්‍යාග කළේ,

(1) ගරු තිස්ස බාලසූරිය පියතුමා ය. (2) 2 වන ජුවාම් පාවුළු පාප්වහන්සේ ය.

(3) ගරු චන්ද්‍රා ප්‍රනාන්දු පියතුමා ය. (4) ජෙරාඩ් ද සිල්වා දේවගැතිතුමා ය.

30. එඬේර සංකල්පය වඩාත් අර්ථවත් ලෙස ඉදිරිපත් කර ඇති බයිබලීය ග්‍රන්ථය වන්නේ,

(1) ගීතාවලිය පොත ය. (2) ඒකසියෙල් පොත ය.

(3) ජොහාන් ශුභාරංචිය ය. (4) යෙසායා පොත ය.

31. සර්පයෙකු පාවුල්ගේ අතේ එල්ලුනද අනතුරක් සිදු නොවීම තුළින් සාක්ෂි දැරුවේ,

(1) සිසිලියාවේදී ය (2) මෝල්ටාවේදී ය (3) ක්‍රිතයේදී ය (4) සුන්දරවරායේදී ය

32. ''සමිදාණන් වහන්ස මේ පාපය ඔවුන් පිට නොතැබුව මැනව'' මෙසේ යාච්ඤා කළේ,

(1) ජේසුස් වහන්සේ ය. (2) පාවුලුතුමා ය.

(3) ස්තේපන්තුමා ය. (4) ලූක්තුමා ය.

33. එපීස නම් නගරය මුල්කරගෙන සිදු වූ ධර්මදූත ගමන වන්නේ,

(1) පළමු ධර්මදූත ගමනයි. (2) දෙවන ධර්මදූත ගමනයි.

(3) තෙවන ධර්මදූත ගමනයි. (4) රෝම ගමනයි.

34. ''යම් තැනැත්තෙකු මා තුළ නොසිටින්නේ නම් ඔහු අත්තක් මෙන් පිටතට දමනු ලැබ වියළී යයි'' මෙලෙස සඳහන් ව ඇත්තේ,

(1) ගීතාවලිය පොතේ ය. (2) ජොහාන් ශුභාරංචියේ ය.

(3) රෝම පොතේ ය. (4) මාර්ක් ශුභාරංචියේ ය.

35. මීකා දිවැසිවරයා විසින් පැවසූ වදනක් වන්නේ,

(1) ''මෙන්න මම මෙහිය මා යැව්ව මැනව.''

(2) ''යුක්තිය ගලාබසින දියදහරක් මෙන්ද ධාර්මිෂ්ඨකම නොසිඳී ගලන ගඟක් මෙන්ද පැවතිය යුතුය.''

(3) ''තමන්ගේ කඩුවලින් නගුල් තලද, හෙල්ල වලින්, දෑකැති ද තලාගනු ලැබේ.''

(4) මාගේ පාපමලින් මා පිවිතුරු කළ මැනව.

36. මිනිසා දේව ප්‍රේමයෙන් ඈත් වීමට බලපෑ මූලික හේතුව වන්නේ,

(1) තන්හාව හා ක්‍රෝධයයි. (2) අකීකරුකම හා තෘෂ්ණාවයි.

(3) ආත්මාර්ථකාමිකම හා පිළිගැනීමයි. (4) ඊර්ෂ්‍යාව හා උඩගුකමයි.

37. අපෝස්තුළුවරු විසින් සිදුකරන ලද ප්‍රථම හාස්කම වන්නේ,

(1) සුදර්ශන දොරටුව අසල කොරා සුවපත් කිරීම.

(2) යුතිකස්ට පණ දීම.

(3) අංශභාග රෝගියෙකු සුව කිරීම.

(4) අන්ධ මිනිසෙකුට පෙනීම ලබාදීම.

38. ක්‍රිස්තුස්වහන්සේ හා සම්බන්ධවීමට අප තුළ ඇති පිපාසාව අපේ ජීවිත ආකල්ප වෙනස්වීම කෙරෙහි බලපාන බව පෙන්නුම් කරන්නේ,

(1) මාර්තා හා මරියාගේ කථාවෙනි.

(2) සමාරිය ස්ත්‍රියගේ කථාවෙනි.

(3) පව්කාර ස්ත්‍රියට ගල් ගැසීමේ සිද්ධියෙනි.

(4) මද්ගලායේ මරියා සොහොන් ගෙය වෙත ගිය සිද්ධියෙනි.

39. නූතන සමාජයේ කිතුණු පවුල් පවා පිරිහෙමින් පවතින බව පෙනී යයි. මෙයට මූලික හේතුව වන්නේ,

(1) එකිනෙකා තේරුම් නොගැනීම. (2) ආර්ථික ප්‍රශ්න විසඳා ගැනීමට නොහැකි වීම.

(3) පවුල පිළිබඳ වගකීම් ඉටු නොකිරීම. (4) දේව කැමැත්තට පිටුපා ක්‍රියා කිරීම.

40. ව්‍යසනකාරී ලෝකයක ජීවත්වන කිතුනු ඔබගෙන් දෙවිඳුන් අපේක්ෂා කරන්නේ,

(1) අපට හැගෙන ආකාරයට ලෝකය යහපත් ලෙස පවත්වාගෙන යෑමයි.

(2) දේව කැමැත්ත මත ලෝකය යහපත් ලෙස පවත්වාගෙන යෑමයි.

(3) ජාත්‍යන්තර තීරණවලට අනුව ලෝකය යහපත් ලෙස පවත්වාගෙන යෑමයි.

(4) සහාවේ එකඟතාව මත ලෝකය යහපත් ලෙස පවත්වාගෙන යෑමයි.

සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

# තෙවන වාර පරීක්ෂණය 2020

**11 ශ්‍රේණිය** **ක්‍රිස්තියානි ධර්මය II** **කාලය පැය 2 යි**

| නම/ විභාග අංකයඃ |
|---|

- පළමු ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්න හතරක් සහිතව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 20 යි. අනෙක් ප්‍රශ්නවලට ලකුණු 10 බැගින් හිමි වේ.

---

(01) (i) ගර්ජනාවේ පුත්‍රයෝ ලෙස නම් කළ සෙබදීගේ පුත්‍රයන් දෙදෙනා නම් කරන්න.

(ii) ''ආදම්'' හා ''ඒව'' යන නම්වල අර්ථය වෙන වෙනම ලියා දක්වන්න.

(iii) රෝම යටත් විජිත සමයේ ජුදෙව්වන්ට ගෙවීමට සිදු වූ බදු වර්ග දෙක නම් කර එම බදු ගෙවීම සඳහා භාවිත කළ කාසි වර්ග 2 නම් කරන්න.

(iv) දර්ශන මඟින් දෙවියන් වහන්සේ දිවැසිවර සේවයට තෝරාගත් දිවැසිවරු දෙදෙනා නම් කරන්න.

(v) ධර්මිෂ්ඨකම නොතකා ක්‍රියා කළ ජුදෙව් ජනයා අවධි කිරීමට හා දේව රාජ්‍යයේ පදනම සාමය බව පිළිබිඹු කිරීමට ජේසුස් වහන්සේ විසින් සිදුකළ ක්‍රියාවන් දෙක වෙන වෙනම ලියන්න.

(vi) පේදුරු තම සහෝදරයාට කමාවිය යුත්තේ කිවාරයක්දැයි ඇසූ පැනයට ජේසුස් වහන්සේ දුන් පිළිතුර හා එහි අදහස ලියන්න.

(vii) ''මරන්න ගෙන යන බැටළුවකු මෙන්ද උගේ ලොම් කපන්නා ඉදිරිපිට ගොළුව සිටින බැටළුවෙකු මෙන් ද උන්වහන්සේ මුඛය නාරින සේක.'' යෙසායා දිවැසිවරයා පැවසූ මෙම අනාවැකිය පහදා දුන්නේ කවුරුන් විසින් කාහට ද?

(viii) වර්තමානයේ අප රටේ කිතුනු සභා එකමුතුව උදෙසා ක්‍රියා කරන ආයතන 2 නම් කරන්න.

(ix) ජුදෙව් පාස්කුව හා කිතුනු පාස්කුව යන්න කෙටියෙන් වෙන වෙනම ලියා දක්වන්න.

(x) කිතුනු පවුලක ජීවත් වන දරුවෙකු සතු වගකීම් 2 ලියන්න. (ලකුණු $2 \times 10 = 20$)

(02) (i) ''දියඹට ගොස් දැල් හෙලන්න'' ජේසුස් වහන්සේ මුල් ශ්‍රාවකයන් කැඳවීම සිදුකරන ලද තිබේරියස් මුහුද හඳුන්වන වෙනත් නම් 2 ක් ලියන්න. (ලකුණු 02)

(ii) ශ්‍රාවකයන් ශුභාරංචි සේවය සඳහා පිටත්කර හැරීමේදී දෙන ලද උපදෙස් හා පවරන ලද කාර්යයන් 3 බැගින් ලියන්න. (ලකුණු 03)

(iii) මෙම ශුභාරංචි සේවාවන් මඟින් කිතුනු ධර්මදූත සේවකයන්ට ලබා ගත හැකි ආදර්ශ 5 ක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)


මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

(03) (i) ජේසුස් වහන්සේ හමුවීමට රාත්‍රියේ පැමිණි පුද්ගලයා කවුරුන් ද? සමාජය තුළ ඔහු දැරූ තනතුර කුමක් ද? (ලකුණු 02)

(ii) ඔහු ඇසූ පැනයට ජේසුස් වහන්සේ ලබාදුන් පිළිතුර හා එහි අදහස ලියා දක්වන්න. (ලකුණු 03)

(iii) ක්‍රිස්තුන් වහන්සේ සමඟ සැබෑ ලෙස සම්බන්ධ වීමට සිසු දරුවන් වන ඔබ තුළ වර්ධනය කර ගත යුතු ගුණාංග 5 විස්තර කරන්න. (ලකුණු 05)

(04) (i) ශුද්ධ වූ පාවුල් තුමාගේ දෙවන ධර්මදූත චාරිකාවට සහභාගී වූවන්ගෙන් දෙදෙනෙකු නම් කරන්න. (ලකුණු 02)

(ii) මෙම චාරිකාවේදී පිලිප්පිය, ඇතන්ස් හා කොරෙන්තිය යනු ස්ථානවල සිදුවූ වැදගත් සිදුවීමක් බැගින් ලියා දක්වන්න. (ලකුණු 03)

(iii) පාවුල්තුමාගේ II වන ධර්මදූත ගමන තුළින් අපට ලබා ගත හැකි ආදර්ශ 5 ක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(05) (i) ශුද්ධාත්ම බලය ලැබූ දින ප්‍රබල දේශනයක් සිදුකළේ කවුරුන් ද? එහි ප්‍රතිඵලය වූයේ කුමක් ද? (ලකුණු 02)

(ii) මුල් කිතුනු සභාව තුළ දක්නට ලැබුණු ලක්ෂණ 3 ලියා දක්වන්න. (ලකුණු 03)

(iii) මුල් සභාවේ සුබසාධන මෙහෙවර ඉදිරියට ගෙනයාමේ දී ඉස්මතු වූ ගැටලුව කුමක් ද? ඔවුන් එය විසදාගත් ආකාරයෙන් වත්මන් කිතුනු අපහට ලබාදෙන ආදර්ශ 3 කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(06) (i) පලස්තීනය රෝම අධිරාජ්‍යයට යටත්ව සිටි සමයේ දේව කැමැත්ත අනුව ජීවත් වීම උදෙසා ජීවිත පරිවර්තනයක් ඇති කිරීමට දිවැසිවරයෙකු ලෙස ක්‍රියා කළ පුද්ගලයා කවුද? එතුමා එම පරිවර්තනය සිදුකළේ කුමක් තුළින් ද? (ලකුණු 02)

(ii) එම දිවැසිවරයාගේ අනුශාසනා ඇසීමට පැමිණි ජන කණ්ඩායම් 3 ක් නම් කර ඔවුන් හට ලබාදුන් අනුශාසනා වෙන වෙනම ලියා දක්වන්න. (ලකුණු 03)

(iii) කිතුනු ඔබගේ ජීවිතයේ වෙනස් විය යුතු ගති පැවතුම් හඳුනාගෙන ජේසුස් වහන්සේගේ පාමුල පරිවර්තනයක් තුළින් ඔබ ගන්නා අලුත් තීරණ 5 ක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(07) පහත සඳහන් මාතෘකා අතරින් 2 ක් තෝරාගෙන කෙටි සටහන් ලියන්න.

(i) තාර්සස්හී සාවුල්ගේ ජීවිත පසුබිම

(ii) මිටියාවතේ දේශනය

(iii) ලකුණු හා ප්‍රාතිහාර්යන්

(iv) සග සම්පත් (ලකුණු 5 x 2 = 10)

## පිළිතුරු පත්‍රය - I පත්‍රය

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. ( 2 ) | 02. ( 1 ) | 03. ( 3 ) | 04. ( 2 ) | 05. ( 4 ) | 06. ( 1 ) | 07. ( 2 ) | 08. ( 3 ) | 09. ( 1 ) | 10. ( 2 ) |
| 11. ( 2 ) | 12. ( 1 ) | 13. ( 1 ) | 14. ( 3 ) | 15. ( 4 ) | 16. ( 4 ) | 17. ( 3 ) | 18. ( 2 ) | 19. ( 2 ) | 20. ( 2 ) |
| 21. ( 2 ) | 22. ( 1 ) | 23. ( 4 ) | 24. ( 3 ) | 25. ( 2 ) | 26. ( 4 ) | 27. ( 2 ) | 28. ( 2 ) | 29. ( 3 ) | 30. ( 1 ) |
| 31. ( 2 ) | 32. ( 3 ) | 33. ( 3 ) | 34. ( 2 ) | 35. ( 3 ) | 36. ( 2 ) | 37. ( 1 ) | 38. ( 2 ) | 39. ( 4 ) | 40. ( 2 ) |

(ලකුණු 1 x 40 = 40)

## II පත්‍රය

01 (i) ජාකොබ් සහ ජොහාන්

(ii) ආදම් - මිනිසා
ඒව - ජීවමාන සියල්ලන්ගේ මාතාව

(iii) * රාජ්‍ය බද්ද - දිනාර් (රිදී කාසි)
* දේවස්ථාන බද්ද - තඹ කාසි

(iv) * යෙසායා * මීකා

(v) * දේව මාළිගාව පවිත්‍ර කිරීම * රාජ තේජසින් ජෙරුසලමට යාම

(vi) * සත්වාර සැත්තෑවකි * සීමා රහිතව සමාවිය යුතු බව

(vii) * පිලිප් විසින් ඉතියෝපීය නපුංසකයාට

(viii) * ශ්‍රී ලංකා බයිබල් සමාගම * ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලය (31 පිටුව)

(ix) * ජුදෙව් පාස්කුව
දෙවිඳුන් ඊශ්‍රායෙල් ජනතාව මිසරයේ වහල්කමින් මුදවාගෙන මෝසෙස්ගේ නායකත්වයෙන් පොරොන්දු දේශයට ගෙන ඒමේ සිද්දිය
* කිතුනු පාස්කුව
ක්‍රිස්තුස් වහන්සේ මරණය පරාජය කර දින තුනකින් නැවත නැගිටීමේ සිද්ධිය

(x) දෙමාපියන්ට කීකරුවීම, ගෞරව කිරීම, උදව් උපකාර කිරීම, හොඳින් අධ්‍යාපනය ලැබීම

(02) (i) * ගලීල මුහුද * ගෙනසෙරෙත් විල

(ii) උපදෙස්
* මල්ලක්වත්, සැරයටියක්වත් නොගෙන යා යුතු වේ.
* චාම් පැවැත්මක් ඇතිව සිටිය යුතු බව.
* සුභ අස්න පිළිගන්නා අය සමග නැවතී සිටින්න.

කාර්යයන්
* යක්ෂයන් දුරුකිරීමේ බලය
* රෝග සුව කිරීමේ බලය
* දේව රාජ්‍ය ප්‍රකාශ කිරීමේ බලය

(12 දෙනා හෝ 70 දෙනාට දුන් ඕනෑම උපදෙස් 3 ක් හා කාර්යයන් 3 ක් ලියා තිබීම) (පිටු : 33)

(iii) * සුභ අස්න ප්‍රමාද නොවී ප්‍රකාශ කළ යුතු බව
* සේවයේදී අභියෝග හා පීඩාවලට මුහුණදීමට සිදුවන බව
* සාමූහිකව සේවය කිරීමෙන් සේවයේ ගුණාත්මක බව වර්ධනය වන බව
* සේවය හා සේවකයන් වෙනුවෙන් යැදීම අත්‍යාවශ්‍යය
* සේවය තුළ සාම පැතුම ගැබ්ව තිබිය යුතු බව (10 පොත 33 පිටුව)

(03) (i) * නිකදේමුස්
* පරිසිවරයෙකු මෙන්ම ගුරුවරයෙක්

(ii) * ''යමෙක් නැවත නූපන්නොත් ඔහුට දෙවියන් වහන්සේගේ රාජ්‍යය දැක ගත නොහැක.''
* අදහස - මව්කුසට පිවිස නැවත ඉපදීම නොව පව්කරුවන් ලෙස මෙලොව බිහිවන මිනිසා පාපයෙන් නිදහස් වී ජේසුස් වහන්සේ ප්‍රකාශ කළ ලෙස අලුත් ජීවිතයක් අත්පත් කර ගැනීමයි.

(iii) * ඇදහිල්ල / කීකරුකම / පාප සමාව / දේව ගරුබිය / ප්‍රේමය ආදී ගුණාංග 5 ක් විස්තර කර තිබීම

(04) (i) සීලස්, තිමෝතියස් හා ලූක්

(ii) පිලිප්පිය
* ලිදියා හා ගෙයි වැසියන් බෞතීස්ම වීම
* වහල් තරුණිය සුවකිරීම හා හිර ගෙදර දැමීම
* හිරගෙයි මුලාදෑනියා ඇතුළු නිවැසියන් ජේසුස් වහන්සේ අදහා ගැනීම

ඇතන්ස්
* ස්ථානෝචිත ප්‍රඥාවෙන් ඇතන්ස් දේශනය කිරීම (රූප නමස්කාරය)
* ජුදෙව්වරුන්, භක්තිවන්තයන් සමග වාද කිරීම

කොරෙන්තිය
* අකිලා, ප්‍රිස්කිලා මුණගැසීම හා ඔවුන් සමඟ කූඩාරම් කර්මාන්තයේ නියැළීම
* සබත් දින ධර්මශාලාවේ වාද කිරීම

## පිළිතුරු පත්‍රය - ඉතිරි කොටස

(iii) * දෙවියන් වහන්සේට හිමි ගෞරවය ලබාදීම.
* ස්ථානෝචිත ප්‍රඥාවෙන් ක්‍රියා කිරීම.
* අභියෝග මැද නොපසුබට වීර්යයෙන් කටයුතු කිරීම.
* දේව හඬට කීකරු වීම.
* අපහසුතා මැද දෙවිඳුන්ට ප්‍රශංසා කිරීම වැනි පිළිතුරු 5 කෙටියෙන් හැඳින්වීම.

(05) (i) පේදුරුතුමා - 3000 ක් පමණ සෙනග සභාවට එකතු වීම

(ii) * ගෙයින් ගෙට යාම * රොටී කැඩීම
* සියල්ල පොදුවේ තබාගැනීම * යාඥා කිරීම (11 ශ්‍රේණිය 38 පිටුව)

(iii) * දිනපතා සහනාධාර දීමේ දී එක් ග්‍රීක වැන්දඹුවක් නොසලකා හැරීම පිළිබඳව ඉදිරිපත් වූ පැමිණිල්ල
* ගැටලුවලට විසඳුම් සෙවීමට ක්ෂණිකව ක්‍රියාත්මක විය යුතු බව
* සාකච්ඡාවෙන් විසඳුම් සෙවිය යුතු බව
* සමානාත්මතාව උසස් කොට සැලකිම (11 ශ්‍රේණිය 41 පිටුව)

(06) (i) ස්නාවක ජොහාන්තුමා / මෙහෙසුරු දිවැසිවරයා / මනස්ථාපනයේ බෞතීස්මය තුළින්

(ii)

| | | | |
|---|---|---|---|
| 1. | පොදු ජනතාව | - | අඳනා දෙකක් ඇති අය නැති අයට දෙත්වා, කෑම ඇති අය නැති අයට දෙත්වා |
| 2. | රාජ්‍ය සේවයේදී සිටි අය | - | නියමිත පමණට වඩා බදු අය කර නොගන්න. |
| 3. | ආරක්ෂක අංශය | - | කිසිවෙකුගෙන් බලහත්කාරයෙන්වත්, කිසිවක් පැහැර නොගන්න. ඔබට ලැබෙන වැටුපෙන් සෑහී සිටින්න. |
| 4. | ජුදා ආගමික ජනතාව | - | ''ආබ්‍රහම් අපගේ පියානෝ' යයි සිතින් කියා නොගෙන මනස්ථාපනය වූ බව දැක්වෙන ලෙස හැසිරෙන්න. |

(ඉහත ඒවායින් 3 ක් තිබීම සෑහේ)

(iii) සිසුන් සපයා ඇති පිළිතුරු සලකා බලා ලකුණු ලබාදෙන්න.

(07) (i) තාර්සස්හී සාවුල්ගේ ජීවිත පසුබිම

තාර්සස් නගරය තුළ පසුබිම, ජුදා පිරිස ආගමික පසුබිම හා රෝම පුරවැසිභාවය කෙටියෙන් හඳුන්වා තිබීම. (11 ශ්‍රේණිය 46, 47 පිටු)

(ii) මිටියාවතේ දේශනය

ලූක් 6 : 20 - 26 සඳහන් භාග්‍ය හා අභාග්‍ය වෙන වෙනම ලියා කෙටියෙන් විස්තර කිරීම (10 ශ්‍රේණිය 123, 124 පිටු)

(iii) ලකුණු හා ප්‍රාතිහාර්යයන්

කාණ්ඩ හතරට වර්ග කර දක්වා ඒවාට අදාල උදාහරණ සපයා තිබීම (10 ශ්‍රේණිය 90 පිටුව)

(iv) සග සම්පත්

මතෙව් 6 : 19 - 21 අනුව ස්වර්ගීය සම්පත්වල වටිනාකම හා ලෞකික සම්පත්වල ආකර්ශනය සසඳා අපේ ජීවිත රැකෙන්න සග සම්පත් වලින් යන අරුත තිබීම. (11 ශ්‍රේණිය 92 පිටුව)